# The Year of the harvest and Thanksgiving (04.01.2019)

## අස්වැන්නේ සහ ස්තුතිදීමේ වසර

මේ අවුරුද්ද අස්වැන්නේ සහ ස්තුතිදීමේ වසර ලෙස මම ප්‍රකාශ කරමි. පසුගිය මාස 6ක කාලය තුළ දේවරාජ්‍යයට ආත්මවල අස්වැන්නක් සඳහා පොළොව සකස් කරමින් සහ යාච්ඤා කරමින්, සූදානම්වෙමින් සිටියෙමු.

නිව්මෝල්ඩන් නගරය ගැලවෙන බවටත් මේ නගරය අපි ලබාගන්නා බව සහ දෙවියන්වහන්සේ මේ නගරය තුළ බලවත් ලෙස ක්‍රියාකරන බවත් අපි ප්‍රකාශ කළෙමු.

අස්වැන්න සහතිකයි *ගලාති 6:7-10 (මැසේජ් බයිබලය) 7-8 නොරැවටෙන්න. දෙවියන්වහන්සේට සරදම් කරන්නට කාටවත් බැරිය. මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපා ගන්නේය. ඒ හැටියට අනෙක් අයගේ අවශ්‍යතා ගැන සහ දෙවියන්වහන්සේ ගැන නොසළකා! තමා ගැන පමණක් සිතා (මාංශය සඳහා) වපුරන්නා (මාංශයෙන් කුණුවීම) වල් පැළෑටි අස්වැන්නක් කපා ගන්නේය. ඔහුගේ ජීවිතය සඳහා ඔහුට වපුරන්නට තිබෙන්නේ ඔහුගේ වල් පැළෑටි පමණක්ය! එහෙත් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ට ඔහු තුළ වර්ධනය කරන ක්‍රියාව කරන්නට ඉඩ දෙමින් දෙවියන්වහන්සේ සඳහා වපුරන්නා සබෑ ජීවනයේ සහ සදාකාල ජීවනයේ අස්වැන්නක් නෙලා ගන්නේය.*

*9-10 තවද යහපත්කම් කිරීමට මැළි නොවෙමු. මක්නිසාද අපි අත්හැර නොදමා, නොනවත්වා සිටියොත් නියම කාලයේදී හොඳ අස්වැන්නක් නෙලා ගන්නෙමු. එබැවින් දැන්ම අපට අවස්ථාව ලැබෙන හැටියට, සියල්ලන්ටම, ප්‍රධානකොට අපට කිට්ටුම අයට එනම් ඇදහිල්ලේ පවුලට අයිතිවූවන්ට, යහපත්කම් කරමු.*

මේ අවුරුද්දේ අපේ අවධානය කාරණා දෙකක් කෙරෙහි යොමු කරනවාට මම කැමතියි.

පළමුවැන්න අස්වැන්න ගැන-මිනිසුන් කෙරෙහි

දෙවැන්න සියලුමදේවල් උදෙසා දෙවියන්වහන්සේට ස්තුතිදීම-ස්තුතිවන්ත සහ ගුණවන්ත සිතක් ඇතිකර ගැනීම.

1 මිනිසුන් කෙරෙහි අවධානය-එඬේරෙක් නැති බැටළුවන් මෙන් සිටි මිනිසුන් දුටුවිට යේසුස්වහන්සේ ඔවුන්ට අනුකම්පා කළසේක. මතෙව් 9:35-38 අපට මෙසේ කියයි.

*යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කරමින්ද සියලු ආකාර ලෙඩ රෝග සුව කරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක.* ***නමුත්*** *උන්වහන්සේ සමූහයන් දැක, ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පා කළසේක.*

උන්වහන්සේ කරන්නට පැමිණි දේවල් වූ ඉගැන්වීම, දේශනාකිරීම සහ සුවකිරීම කරමින් යේසුස්වහන්සේ ඇවිද්ද **නමුත්** මිනිස්සු සිටිය ආකාරය දුටුවිට යේසුස්වහන්සේ තුළ අනුකම්පාවක් ඇති විය. ඉගැන්වීම, දේශනාකිරීම සහ සුවකිරීම ගැන අපි සිතට ගන්නවා විය හැකි වුනත් අද මිනිස් වර්ගයා සිටින තත්වය ගැන අපට අනුකම්පාවක් දැනෙන්නේ නැත්නම් අපගේ එල්ලය වැරදෙයි. මිනිස් වර්ගයාගේ ස්වභාවය දුටුවිට යේසුස්වහන්සේ ඔවුන් කෙරෙහි අනුකම්පා කළසේක. අද මිනිස් වර්ගයා සිටින ස්වභාවය/ආකාරය දකින විට අපි අනුකම්පාවෙන් පෙළඹී ජ්වලිතවීමක් අප තුළ ඇතිවෙන ලෙස මම යාච්ඤා කරමි.

අද බොහෝ මිනිසුන් අනාගතයක් සහ බලාපොරොත්තුවක් නැතිව, යන එන මග නොදැන ජීවිතය නැමැති වනාන්තරයේ මංමුලාවී ඇවිදින බැටළුන් වාගේය. අප අවට සිටින නැතිවී සිටින්නන් කෙරෙහි කිසිම සැකිල්ලක් නැතිව, අපව සතුටු කරගැනීමට, හොඳ/ආශීර්වාදලත් කාලයක් ගත කරන්නට අප දේවස්ථානයට එනවා **නම්** අපට එල්ලය වැරදී ඇත. අප අවට සිටින, යේසුස්වහන්සේ නොදන්නා, සදාකාල විනාශයට යන අය කෙරෙහි අනුකම්පාවක් හෝ කිසිම සැලකිලිමත්මක් අපට නැති **නම්** අපේ රැස්වීම් නිශ්ඵලය. මනුෂ්‍යයන් කෙරෙහි අප තුළ පවතින අනුකම්පාව සහ සැලකිල්ල, ඒ පිළිබඳව යමක් කිරීමට අපව යොමු කරවිය යුතුය. ඒ ගැන යමක් නොකරනවා නම් ඒ අනුකම්පාව තිබීමේ ප්‍රයෝජනයක් නැත. අපට කරන්නට හැකි පහසුම දේ නම් ඇවිත් යේසුස්වහන්සේ අත් දැක බලන්න කියා මිනිසුන්ට ආරාධනා කිරීමයි. දේවරාජ්‍යය යනු මිනිසුන්ය, සභා ගොඩනැගිලි හෝ ආගම හෝ බැතිමත් ජීවිතයක් ගත කිරීම පමණක් නොවේ. එය මිනිසුන් උදෙසා කළ හැකි සියල්ලම කිරීමයි. මිනිසුන් ගැන යාච්ඤා කිරීම හොඳයි. මිනිසුන්ට ආරාධනා කිරීම සහ ඔවුන්ට යේසුස්වහන්සේව අත් දකින්නට හැකිවෙන පිණිස ශාරීරිකව තව ටිකක් වැඩි දුරට ගොස් ඔවුන් දේවස්ථානයට කැඳවාගෙන එන්නට හැකි නම් ඊටත් වඩා තවත් හොඳයි.

මේ අවුරුද්දේ අප කෙරෙහිම යොමුවී තිබෙන අපේ අවධානය අපගෙන් ඉවත් කරගෙන යේසුස්වහන්සේ මුණගැසෙන මිනිසුන්ගේ ප්‍රතිලාභය උදෙසා අපි යොමුවෙමු.

ඒ වෙනුවෙන් ඔබට කළ හැකි ප්‍රායෝගික කාරණා කීපයක් මෙන්න: කවුරුන් හෝ සභාවේ නැත්නම් ඔවුන්ගේ අංකය ලබාගෙන ඔවුන්ට කතාකරන්න. අපෙන් කෙනෙක් එය කරන තුරු නොසිටින්න. සභාවට එන්නට යම් කෙනෙකුට වාහන පහසුකමක් අවශ්‍ය නම් ගොස් ඔවුන් කැඳවාගෙන එන්න. ඔවුන්ට යාච්ඤාවක් අවශ්‍ය නම් යාච්ඤා කරන්න. ඔවුන්ට තිබෙන්නේ මුදල් අවශ්‍යතාවයක් නම් මුදල් ටිකකින් හෝ කෑම හෝ ඇඳුම් හෝ අවශ්‍ය නම් ඒ ආකාරයට ඔවුන්ට ආශීර්වාද කරන්න. සහායදීමට සහ යාච්ඤා කිරීමට, සතියේ මැද තිබෙන රැස්වීම් වලට සහභාගි වන ලෙස එකිනෙකා දිරි ගන්වන්න. වැඩකට නැති ආකල්ප සහ නිශ්ඵල නිදහසට කාරණා ගැන එකිනෙකාට අභියෝග කරන්න. යකඩෙන් යකඩ මුවහත්වෙන්නාක් මෙන් අමාරු ප්‍රශ්න අසමින් එකිනෙකාගේ දැනුම වැඩි දියුණු කරන්න. ඇතුළත බලනවාට වඩා පිටත බලන්නන් වෙන්න.

2 සියල්ලම ස්තුතිදීම සහ කළගුණ සැලකීම සමග කරන්න-මේ අවුරුද්ද දෙවියන්වහන්සේ කවුද යන්න සිතෙහි තබාගෙන සහ දිනපතා මැසිවිලි නොකියා උන්වහන්සේට ස්තුති කරන අවුරුද්දක් වේවා.

ස්තුතිදීම 2019 අවුරුද්දේ ජීවන රටාව වේවා. හෙබ්‍රෙව් 13:15 එබැවින් දෙවියන්වහන්සේගේ නාමයට ස්තුති කරන තොල්වල ඵල වන ප්‍රශංසාව නමැති පූජාව උන්වහන්සේම කරණ කොටගෙන නිතරම දෙවියන්වහන්සේට ඔප්පුකරමු. පූජාව සහ ප්‍රශංසාව විරුද්ධ පද ලෙස පෙනෙන්ට පුලුවන. පූජාව ගැන අපි සිතන්නේ අපට විශාල වියදමක් දරා ඔප්පු කරන්නට වන යම්දෙයක් කියාය. අනෙක් අතට ප්‍රශංසාව, ගුණවන්ත සිතකින් බුබුලු දමා උතුරන ප්‍රීතිමත් දෙයක් මෙන් පෙනේ. කෙසේවෙතත් පූජාව සහ ප්‍රශංසාව ආත්මික තලයේදී එකට සම්බන්ධව තිබේ. සමහරවිට ප්‍රශංසාවට වියදමක් කරන්නට සිදු නොවෙයි. උදාහරණ: වැඩක් හොඳින් කළ විට හෝ යම් වීර ක්‍රියාවකට අපි ප්‍රශංසා කරන්නෙමු. දෙවියන්වහන්සේ අපට ආශීර්වාද කළ විට, උපකාර කළ විට, අපව ආරක්ෂා කළ විට, උන්වහන්සේට ප්‍රශංසා කිරීම බොහෝ විට අපට පහසුය. අපට උන්වහන්සේ කෙරෙහි ත්‍යාගශීලී බවක් දැනෙයි. එය අපට දකින්නට හැකි නිසා අපට සිංදු කියන්නට, නමස්කාර කරන්නට සහ උන්වහන්සේ කොතරම් හොඳද කියා කතා කරන්නට පුලුවනි. එවැනි ප්‍රශංසාව වටිනවා වුනත් අපට කිසිම වියදමක් වෙන්නේ නැත. එය පූජාවක් නොවේ.

එසේවුනත් දෙවියන්වහන්සේ පෙනෙන්නට ආවේ නැති, දොස්තර වාර්තා නරක්වූ, සහකරු/සහකාරිය දික්කසාද වෙන්නට ඕනෑ කියා කියද්දී, දෙවියන් වහන්සේ ඉතා ඈතින් සිටී කියා දැනෙන වෙලාවේ අපට කරන්ට ඕනෑවෙන අන්තිමම දේ තමා ප්‍රශංසා කිරීම. එවැනි අවස්ථාවල දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නට පෞද්ගලික කැපකිරීමක් පූජාකිරීමක් අවශ්‍යයි. අපට

තේරුම් ගත නොහැකි දෙවිකෙනෙකුගේ පූජාසනය මත අපේ සියලුම දේවල් තැබීමට අපේ කැමැත්තෙන් කරන ක්‍රියාවක් අවශ්‍යයි. අපි "ප්‍රශංසාවේ පූජාවක්" ගෙන එන විට, අපි සිදුවිය යුතුයැයි සිතන ආකාරයට අපේ ජීවිතයේ දේවල් සිදු නොවුනත්, දෙවියන්වහන්සේ තවමත් යහපත්, තවමත් විශ්වාසය තැබිය හැකියි කියා විශ්වාස කිරීමට අපි තෝරා ගන්නෙමු. (ගීතාවලිය 135:2 ඔව්, උන්වහන්සේගේ ගෘහ මළුවල සිටින උන්වහන්සේගේ සෙනග උන්වහන්සේට ප්‍රශංසා කෙරෙත්වා. නාහුම් 1:7 ස්වාමින්වහන්සේ යහපත්ය. කරදර එනවිට යායුතු උන්වහන්සේ වෙතටය! උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන සෑමදෙනා ගැනම උන්වහන්සේ දන්නාසේක!)

සෙනගක් ලෙස ස්තුතිවන්ත වීමට සහ එසේ කිරීමට එකිනෙකා දිරිගැන්වීමට මේ අවුරුද්දේ අපි අධිෂ්ඨාන කරගනිමු. කවුරු හරි මැසිවිලි නගනවා නම් ස්තුතිවන්ත වෙන්නට කියා ඔවුන්ට අපි මතක්කර දෙමු. කොලොස්සි 3:17

විඩාවට පත්නොවෙන්න, අත්හැර නොදමන්න- ඔබ තුළ සිටින උන්වහන්සේ කවුද කියන වග දැනගෙන, ඔබ දිනපතාම නොකඩවා උන්වහන්සේට ගුණවන්තව, ස්තුති කරන විට මෙය ඔබේ අස්වැන්නේ අවුරුද්දයි.